## <u>සංකල්ප පත්‍රිකාව</u>

## <u>ජනජීවිතය  සුරක්ෂිත කිරීම සඳහා අලි මිනිස් සහජීවනය - උප සංරචක 2 b සඳහා රූපවාහිනී වාර්තාමය වැඩසටහනක් නිෂ්පාදනය කිරීම</u>

**හැඳින්වීම:** ලෝකයේ වර්තමානයේ වෙසෙන අලි විශේෂ දෙක වන අප්‍රිකානු අලි හා ආසියානු අලි අතුරින් ආසියානු අලි, ආසියාතික රටවල් 13කට සීමා වී ඇති අතර සංඛ්‍යාවෙන් 40,000කට අධික නොවේ. මින් වැඩිම ආසියානු අලි ගහණයට ඉන්දියාව හිමිකම් කීවද වැඩිම වනඅලි ගහන ඝණත්වයට හිමිකම් කියනුයේ ශ්‍රී ලංකාවයි. 2011 දී සිදු කරන ලද දීපව්‍යාප්ත වනඅලි සමීක්ෂණයට අනුව මෙරට වනඅලි ගහණය 5879ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ගොඩබිමින් අන් කිසිදු රටකට සම්බන්ධ නොමැතිව වර්ග කි.මි. 65610ක භූමි ප්‍රදේශයක් සහිත දූපත් රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව තුල මිලියන 21ක් පමණ වූ මිනිස් ජනගහනයක් සමග මෙවැනි අලි ගහණයක් පවත්වා ගැනීම විශාල අභියෝගයකි. මෙම අභියෝගය තවදුරටත් තීව්‍ර වන්නේ මෙරට වන වැස්ම 29.7%ක් වීමත් එයින්ද තෙත් කලාපීය වනාන්තරවල ජීවත්වන වනඅලි ඉතා කුඩා සංඛ්‍යාවක් හැරුනුකොට 95%ක් පමණ වියලි කලාපිය වනාන්තර වලට සීමා විම හේතුවෙනි. ස්වභාවික හේතු මත මියයන අලි සංඛ්‍යාවට සාපේක්ෂව විශාල අලි සංඛ්‍යාවක් අලි-මිනිස් ගැටුම හේතුවෙන් වාර්ෂිකව මියයන අතර සියලු ආකාරයේ හේතු මත වාර්ෂිකව මියයන මුළු අලි සංඛ්‍යාව 200 ඉක්මවයි. එසේම වනඅලි පහරදීමෙන් වාර්ෂිකව මියයන මිනිසුන් ගණන 60-80 ක් පමණ වේ. තවද වනඅලි පහරදීමෙන් වාර්ෂිකව මිනිස් ශාරීරික හානි 70-80ක් පමණද දේපොළ හානි 1000කට අධිකව සිදු වේ. වගා හානිද විශාල ලෙස සිදු වන අතර ඒ පිළිබඳ නිවැරදි සංඛ්‍යාලේඛන පවා නොමැති නමුදු වියළි හා අතරමැදි කලාපයේ ගොවියාට වනඅලින්ගෙන් සිදුවන පීඩාව සුළුපටු නොවේ. මෙවැනි වාතාවරණයක් යටතේ වන අලි සහ මිනිසුන් එකිනෙකාට එරෙහිව බරපතල ගැටුමකට අවතීර්ණව සිටි. මෙම තත්වය යටතේ අලි-මිනිස් ගැටුම වර්තමානයේ ඉතා බරපතල සමාජ ආර්ථික ගැටළුවක් මෙන්ම සංරක්ෂණ ගැටළුවක් බවටද පත්ව ඇත.

අලි - මිනිස් ගැටුම අවම කිරීම පිණිස පසුගිය දශක දෙකක පමණ කාලය තුල ගෙන ඇති උත්සාහයද, දරා ඇති පිරිවැයද අතිවිශාල වන අතර ඊට සාපේක්ෂව ලබාගෙන ඇති ප්‍රතිපල බොහෝ අල්පය. ඊට බලපා ඇති කරුණු බොහෝ සංකීර්ණ වන නමුදු ප්‍රධානම හේතු කිහිපයක් වනුයේ වනඅලි රක්ෂිත තුලට සීමා කිරීම තුලින් අලි - මිනිස් ගැටුම අවම කල හැකිය යන සංකල්පයත්, පරිස්ථාපනය කරනු ලබන වනඅලි වෙනත් රක්ෂිත වලට නිදහස් කිරීමෙන් ගැටලුකාරී වනඅලින්ගෙන් සිදුවන හානි වැලැක්විය හැකිය යන පූර්ව නිගමනයත් වනඅලි සංරක්ෂණය හා අලි මිනිස් ගැටුම අවම කරලීම පිණිස ජනතා සහභාගිත්වය සක්‍රියව ලබා ගැනීම පිණිස ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීමත් සමාන්තර ආයතන සමග අන්තර් ආයතනික සම්බන්ධීකරණය දුර්වල වීමත් යන කරුණුය.

වනඅලි සංරක්ෂණය හා කළමනාකරණය නව මානයක් කරා ගෙන යනලද සුවිශේෂී සන්ධිස්ථානයක් 2006 වර්ෂයේදී සනිටුහන් වන්නේ වනඅලි සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව එළිදැක්වීමත් සමගිනි. මෙම ජාතික ප්‍රතිපත්තිය තුල වනඅලින්ගේ දිගුකාලින සංරක්ෂණය, අලි මිනිස් ගැටුම අවම කිරීම, වනඅලි සංරක්ෂණය තුලින් සමාජ ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම, වනඅලි හානි ප්‍රතිපූරණය හා වනඅලි සංරක්ෂණයේ පදනම ලෙස විද්‍යාත්මක පර්යේෂණ දිරිමත් කිරීම යන වැදගත් ප්‍රතිපත්තීන් අන්තර්ගත වේ.

විවිධ හේතු මත මෙම ජාතික ප්‍රතිපත්තියෙහි අන්තර්ගත ප්‍රතිපත්ති පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම තුල අපේක්ෂා කල පරිදි ප්‍රතිපල ලබා ගත නොහැකි වුවද යම් පමණක සාර්ථක ප්‍රගතියක් ළඟාකර ගැනීමට හැකි විය. එසේම සිදු කරන ලද විද්‍යාත්මක පර්යේෂණ මගින් වනඅලින්ගේ නිවාස පරාසයන්, සංක්‍රමණික රටා ඇතුළු ඔවුන්ගේ සංරක්ෂණයට මෙන්ම අලි මිනිස් ගැටුම අවම කරගැනීමෙහිලා වැදගත් තොරතුරු රැසක් අනාවරණය කර ගැනීමටද හැකිවිය.

**අලි-මිනිස් සහජීවනය:** අතීතයෙන් උගත් පාඩම් හා විද්‍යාත්මක පර්යේෂණ ඇසුරින් ලත් තොරතුරු පදනම් කර ගනිමින් වනඅලින්ගේ දිගුකාලින පැවැත්ම තහවුරු කිරීමටත් අලි මිනිස් ගැටුම අවම කරලමින් වනඅලි සංරක්ෂණය තුලින් සමාජ ආර්ථික ප්‍රතිලාභ සහතික කිරීම හරහා වනඅලි, හානිකර සාධකයක් නොව ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික සම්පතක් බවට පත්කර ඔවුන් සංරක්ෂණය සඳහා ප්‍රජාවගේ ඍජු දායකත්වය ලබා ගැනීමටත් හැකි වන පරිදි අලි-මිනිස් සහජීවනය (Human Elephant Coexistence) නමින් නව ආකාරයක සංකල්පයක් හඳුන්වාදීමට ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP) යටතේ සැලසුම් කර ඇත.

මෙහි මූලික සිද්ධාන්තය වනුයේ වනඅලි සහ මිනිසුන් ස්ථිරවම වෙන් කර අලි මිනිස් ගැටුම අවම කිරීම ප්‍රයෝගික නොවන බැවින් දෙපාර්ශවය එකම භූමි ප්‍රදේශයක, පවතින සීමිත ස්වභාවික සම්පත් බෙදාහදා ගනිමින්, සහජීවන ජීවන රටාවක් තුල එකිනෙකාට සිදුවන හානි අවමකරගනිමින් ජීවත්වීමට කටයුතු සැලසීමයි. ඒ අනුව හැකිතාක් දුරට වනඅලින්ගේ වාසභූමි ආරක්ෂා කරදෙමින් වනඅලින් මිනිස් ජනාවාස තුලට ඇතුල්වීම, ගම්මාන වටා ඉදිකරනු ලබන විදුලි වැට මගින් වලක්වා, වනඅලින්ට ආහාර සහ ජලය සොයාගැනීම පිණිස ඇති අවකාශ හැකිතාක් දුරට පුළුල් කිරීම සඳහා වී වගා කරනු ලබන කුඹුරු බිම්, අස්වනු නෙලාගන්නාතෙක් පමණක් තාවකාලික විදුලිවැට මගින් ආරක්ෂාකොටදීමට පියවර ගනු ඇත. මේ තුලින් පමණක් අපේක්ෂා කරනු ලබන සහජීවන තත්වය නිර්මාණය නොවන අතර ගැටුමට පාත්‍රවූ ප්‍රජාව මෙම නව සංකල්පය වෙත දිනාගැනීම පිණිස දැනුවත්කිරීම හා පුහුණු කිරීම, විවිධ පාර්ශවකරුවන් දැනුවත්කර ඔවුන්ගේ සහය මෙයට ලබා ගැනීම, ප්‍රාදේශීය පරිපාලනයේ මූලිකත්වයෙන් පාර්ශවකරුවන්ද දායක කර ගනිමින් ආයතනික යාන්ත්‍රණයක් හරහා මෙම වැඩපිළිවෙල තිරසාරලෙස දිගුකාලීනව ක්‍රියාත්මක කිරීම මෙන්ම ආර්ථික ප්‍රතිලාභ ඇතිකරදීම හා හානි ප්‍රතිපූරණය වැනි බහුවිධ ප්‍රවේශයක් තුලින් මෙකී සහජීවනය යථාර්තයක් කරගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම වැඩසටහන, එකවර මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවට නියමු ව්‍යාපෘති මට්ටමින් අලි මිනිස් ගැටුම වඩාත්ම උග්‍ර දිස්ත්‍රික්ක දෙකක් වන කුරුණෑගල හා අනුරාධපුර දිස්ත්‍රික්ක දෙක තුල නිශ්චිත නිර්ණායක මත තෝරාගන්න ලද ගම්මාන වල මෙම වැඩසටහන ක්‍රියාත්මකකොට ඉන් ලැබෙන ප්‍රතිපල අධ්‍යයනය කිරීමෙන් පසු අනෙකුත් ප්‍රදේශ වෙත මෙම "අලි-මිනිස් සහජීවන" වැඩසටහන ව්‍යාප්ත කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.

මෙම වැඩසටහන ආරම්භ කිරීම සඳහා ග්‍රාමීය ප්‍රජාව ඉතා සංවේදී ලෙස සියුම්ව දැනුවත්කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වන අතර යෝජිත රූපවාහිනී වාර්තාමය වැඩසටහන මගින් ඊට විශාල දායකත්වයක් අපේක්ෂා කරනු ලැබේ. ඊට පහත ඇතුලත් වීම අවශ්‍යවේ.

1. නිමාවක් නොවන අලි මිනිස් ගැටුමේ සමාජ ආර්ථික පිරිවැය.
2. අලි පලවා හැරීම, අල්ලා ඉවත් කිරීම, රක්ෂිතවලට වනඅලි සීමා කිරීම වැනි සම්ප්‍රදායික කළමනාකරණ ක්‍රමවේද වල අසාර්ථකබව හා අලි වෙඩි වලට වන අලි හුරු වීම හේතුවෙන් ඒ මත දිගින් දිගට විශ්වාසය තැබීමේ නොහැකියාව.
3. වනඅලි සංරක්ෂණයේ ඍජු හා වක්‍ර ප්‍රතිලාභ.
4. වනඅලි සංරක්ෂණයේ දේශීය හා අන්තර්ජාතික වැදගත්කම.
5. ස්වභාවික සම්පත්වල සීමාසහිතබව හා වනඅලින්ගේ ආහාර හා ජල අවශ්‍යතා සපුරාලීමේ අභියෝග ජයගැනීමේදී win-win තත්ත්වයක අවශ්‍යතාවය.
6. අලි-මිනිස් සහජීවන අතීත අත්දැකීම් හා වර්තමාන භාවිතයන්
   අලි මිනිස් සහජීවනය වත්මන් මිනිස් සමාජයට නවමු සංකල්පයක් වුවද ඇත අතීතයේදී අලි සහ මිනිසුන් අතර අද පවතින ආකාරයේ ගැටුමක් නොතිබිණි. දැනුදු අදිවාසී වැදි ජනතාව වනසතුන් සමග ගැටුමකින් තොරව ජීවත්වන ආකාරය දැකිය හැක. එසේම මෑතකාලීනව කුරුණෑගල දිස්ත්‍රික්කය තුල රාජ්‍ය නොවන සනවිධානයක් විසින් හඳුන්වා දෙන ලද ග්‍රාමීය ප්‍රජාව විසින්ම

නඩත්තු කරගනු ලබන ග්‍රාමීය විදුලි වැට ක්‍රමය සහ වගා වැට යෝජනා ක්‍රමය අතුරින් ග්‍රාමීය විදුලි වැට ක්‍රමය පසුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වයක් ඇති බවට තහවුරු වී ඇත. (එබැවින් අලි මිනිස් ගැටුම උග්‍රව පවතින අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්ක තුල මෙම වැඩසටහන ආරම්භ කර අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.)

7. ගැටුම නිමා කිරීම පිණිස පුළුල් ප්‍රජා සහභාගීත්ව ප්‍රවේශයක ඇති වැදගත්කම.
8. අලි-මිනිස් සහජීවනය සඳහා ප්‍රජාවගේ කාර්යභාරය.
9. දිගුකාලින සංහිඳියාවකට පාර්ශවකරුවන්ගේ දායකත්වය කෙසේ වියයුතුද?
10. සහජීවන වැඩපිළිවෙල තුලින් ජනතාවට ලැබියහැකි වක්‍ර ප්‍රතිලාභ වැනි කරුණු හා අමතර වශයෙන් වැදගත්වියහැකි වෙනත් කරුණු.